**ශීර්ෂය 402 - ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දිමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට

**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------------

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 7. 2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනය විසින් වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරනු ලබන ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුලත් නොකල යුතු අතර, එම ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුල ගැලපීම් කල යුතු බවත් ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු බවත් සඳහන් වේ. නමුත් මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් ලෙස රු.21,159,297 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණද ඉකුත් වර්ෂ සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු දක්වා නොතිබුණි. | අදාළ නිරීක්ෂණය සමඟ එකඟ වේ. ඉදිරි වර්ෂවල දී අදාළ අනුරූපී සංසන්දනාත්මක සංඛ්‍යා තොරතුරු සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛයෙහි විධිවිධානවලට අනුකූලව පිළියෙල කළයුතු වීම. |
| (ආ) | **තැන්පතු ගෙවීම්**<br>මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය අනුව තැන්පතු ගෙවීම රු. 11,783,274 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ තැන්පතු ගෙවීම් එකතුව රු. 11,473,437 ක් විය. ඒ අනුව රු.309,837 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. මෙම වෙනස තරුණ හා ක්‍රීඩා | ශේෂ පිරික්සුමේ දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ තුළ තැන්පත් ගෙවීම් එකතුව රු.11,473,437 තුළ මුදල් හා හරස් සටහන්වලින් කරන ලද ගෙවීම් අන්තර්ගත වේ. මෙහි සඳහන් කර ඇති වෙනස වූ රු.309,837,00 ක අගය සමන්විත | මූල්‍ය ප්‍රකාශන චක්‍ර ලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කළයුතු වීම. |

| | | |
|---|---|---|
| අමාත්‍යාංශයෙන් කරන ලද වැරදි ගණුදෙනුවක් සටහන් වීම ලෙස වාර්තා වී ඇති අතර 2021 නොවැම්බර් මස අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට අවශ්‍ය පියවර ගත්තද භාණ්ඩාගාර වාරතා **SA-30** (වාර්ෂික තැන්පතු ගිණුම් සාරාංශ වාර්තාව) අනුව මෙම සටහන් නිවැරදි වී නොතිබුණි. | වනුයේ නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයට අදාළ රු.197,727,00ක් හා රු.112,110 කි. එම සටහන් ක්‍රීඩා අමාත්‍යංශය මගින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හරහා අපගේ 6000-0-0-0-13-0-163-0 දරණ ගිණුම් තුලින් වැරදි නිවැරදි කිරීමක් සිදුකර ඇත. මේ අනුව, අපගේ 2021.12.31 දිනට වූ ශේෂ පිරික්සුමේ අගය වූ 11,473,437.00 (මුදල් හා හරස් සටහන්වල එකතුව) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගෙවීම් යටතේ නිවැරදිව දක්වා ඇත. | |

(ඇ) **අත්තිකාරම් ගෙවීම්**

| | | |
|---|---|---|
| අත්තිකාරම් ගෙවීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය දක්වා ඇති අගය රු.6,431,231 ක් විය. මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එය රු.6,852,198 වූ අතර ඒ අනුව අත්තිකාරම් ගෙවීම් වල රු.420,967 ක වෙනසක් පැවතුණි. | එකඟ වෙමි. අධ්‍යාපන අමාත්‍යාංශයට මාරු වී ගිය නිලධාරියෙකුගේ ශේෂයක් Cigas පද්ධතිය හරහා ගිණුම්ගත කිරීමේදී සිදු වූ දෝෂයක් හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පිළියෙල කළයුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**
**------------------------**

**2.1 වියදම් කළමණාකරනය**
**---------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය අනුව වියදම් ප්‍රකාශය ACA-2(ii) ආකෘතියේ මුදල් පොත අනුව වියදම සහ මු.රෙ 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු විසින් වැයකළ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) වෙන වෙනම දක්වා මුළු වියදම ඉදිරිපත් කළයුතු වුවද,වැය විෂයන් 21කට අදාලව භාණ්ඩාගාර වාර්තා අනුව රු.574,295,695 ක් වූ වියදම, මුදල් පොත අනුව රු.125,911,575 ක් වන වියදමට එකතුකර මුළු වියදම රු.700,207,270 ක් ලෙස දක්වා තිබූ අතර මු.රෙ 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් වැයකළ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) නොමැති ලෙස මූල්‍ය ප්‍රකාශණයේ දක්වා තිබුණි. | මෙහි දක්වා ඇති පරිදි SA 11 අනුව වෙනත් ශීර්ෂ මඟින් සිදුකරන ලද හර කිරීම් මුළු වියදම තුළ (ACA - 2(ii)) ඇතුළත් කර ඇති අතර මු.රෙ.208 අනුව ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් නිරූපණය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛයෙහි විධිවිධානවලට අනුකූලව පිළියෙල කළයුතු වීම. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි ඡේද අංක 3.3 අනුව වාර්තාකරණ ආයතනයේ බැදීම් හා වගකීම් 2021 දෙසැම්බර් 31 දිනට හෙළිදරව් කල යුතු වුවද රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ භාණ්ඩ හා සේවා ලැබීමට අදාලව ගෙවීමට නොහැකි වූ රු.2,517,356 බැරකම් 2022 වර්ෂයේ ගෙවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස ඇතුළත් කර නොතිබුණි. | එකඟ වෙමි. 2021 වර්ෂය සඳහා වූ බැරකම් 2022 ජනවාරි මස, Cigas පද්ධතියට ඇතුළත් කිරීමේ දී සිදු වූ දෝෂයක් හේතුවෙන් අදාළ බැරකම් වාර්තා වී නොමැත. | චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාරව මුදල් වර්ෂයට අදාල සියලුම බැරකම් ඊළග වර්ෂයට ගෙන නොයා එම මුදල් වර්ෂය තුළදීම ගෙවා නිදහස් කළ යුතු බව. |

## 2.3 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

--------------------------------------------

පහත සඳහන් කරුණ නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති රීති රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 377 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.868,060 | කාර්යය නිමවූ වහාම ලබාගත් අත්තිකාරම් පියවිය යුතු වූවත් ,නිළධාරීන් 18 කට ලබාදුන් රු.868,060 ක් වූ අත්තිකාරම් පියවීමට දින 7 සිට මාස 4 ක් දක්වා කාලයක් ගෙන තිබුණි. | 2021 වර්ෂයේ මාර්තු මස සිට ඔක්තෝම්බර් මස දක්වා ලබාගන්නා ලද අත්තිකාරම් 18 සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව පියවීම සඳහා ප්‍රමාදයන් සිදුවී ඇති බව පිළිගනිමි. නමුත්, ඒ තුළ ඇතුළත් අත්තිකාරම් 05ක් ලබාගත් දින සිට දින 07කට අඩු කාලයක් තුලදී මුදලින් පියවා ඇත. මෙසේ අත්තිකාරම් පියවීම් වල ප්‍රමාද වීම් සිදුවී ඇත්තේ අප්‍රේල් මස සිට උත්සන්න වූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් අවම මට්ටමක පැවතීම නිසා නිලධාරීන් කාර්යාලයට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | පැමිණීමද අවම මට්ටමක පැවතීම හේතුවෙනි. එහෙත්, මින් ඉදිරියට අත්තිකාරම් ලබාගත් අදාළ කාර්යය අවසන් වූ විගස අදාළ අත්තිකාරම පියවිය යුතු බවට අභ්‍යන්තර ලිපියක් මඟින් අමාත්‍යාංශයේ සියළුම අංශ දැනුවත් කරන බවට කාරුණිකව දන්වා සිටී. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යය සාධනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩා පාසල් සංවර්ධන කිරීමේ වැඩසටහන යටතේ ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීමට අදාළ ක්‍රීඩකයෙක් බිහි කිරීම සඳහා ළමා වියේ සිටම දක්ෂතා සහිත දරුවන් හඳුනාගෙන ඔවුන්ට නිසි පෝෂණය හා පුහුණුව සහිතව රැක බලා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමග ස්ථාපිත ක්‍රීඩා පාසල් 30 කින් සංවර්ධනය කළ යුතු පාසල් 16 ක් ප්‍රමුඛතා පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේ ද සහයෝගය මත තෝරාගෙන 2021 වර්ෂයේදී රු.මිලියන 210.87 ක ප්‍රතිපාදන සලසා දී තිබුණි. මින් 2021 වර්ෂයේ ව්‍යාපෘති ආරම්භ කරන ලද පාසල් සංඛ්‍යාව 11 ක් වේ. (2020 දී 5 කි) 2021 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 158.72 ක් වියදම් සිදුකර තිබූ අතර පාසල් 03 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. | ත්‍රිවිධ හමුදා විසින් සකස් කර අමාත්‍යාංශයට යොමු කරන ලද ඇස්තමේන්තු පරීක්ෂාකර විෂය පථයට අනුකූල නොවූ ඉදිකිරීම් පිළිබඳව නැවත සලකා බලා සංශෝධිත ඇස්තමේන්තු නැවත අමාත්‍යාංශය වෙත යොමු කිරීමට හමුදාවන්ට යම් කාලයක් ගත විය. සංවර්ධන කාර්යයන් සිදුකරගෙන යාමේදී පෙර හඳුනා නොගත් අතිරේක කාර්යයන් හඳුනා ගැනීම නිසා ඇස්තමේන්තු සංශෝධනයට සිදුවීම හා අදාළ සංවර්ධන කාර්යයන් සිදුකරගෙන යාමේදී හමුදා අනුබණ්ඩ කොවිඩ් ආසාදනය වීම නිසා ව්‍යාපෘති ප්‍රමාද වූ අවස්ථා කිහිපයක්ම වාර්තා විය. | අපේක්ෂිත කාර්යය සාධනය ලබා ගත හැකි වන පරිදි ව්‍යාපෘති නියමිත ප්‍රමිතීන්ට අනුව සැළසුම් කළ යුතු අතර ඉදිකිරීම් කටයුතු කළමණාකරණය හා නියාමනය කළ යුතු වීම. |
| (ආ) | අතිදුෂ්කර ප්‍රදේශවල ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 09 ක ක්‍රීඩා පිටි 43 ක් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශය රු.මිලියන 60.825 ක් වූ ප්‍රතිපාදන නිදහස් කර තිබුණු අතර රු.මිලියන 14.254 ක් වැය කර | මෙම ව්‍යාපෘතියේ ස්වභාවය අනුව වර්ෂය මුලදී සියලු ව්‍යාපෘති ආරම්භ කළ නොහැකි අතර අවශ්‍යතාවය මත යෝජනා ලැබෙන පිළිවෙලට ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදී. වර්ෂය මුල භාගයේ පැවති | ඉදිකිරීම් සඳහා නියමිත කාල රාමුව නිවැරදිව සැළසුම් කළ යුතු වීම හා සැළසුම් කළ යුතු කාර්යය |

| | | |
|---|---|---|
| තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා පිටි 38 ක වැඩ අවසන් කර තිබුණද, ගිවිසුම් අත්සන් කළ එහෙත් ඉදිකිරීම් කටයුතු ආරම්භ නොකල ව්‍යාපෘති 02 ක් හා වැඩ නිම නොකල ව්‍යාපෘති 03 ක් පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය නිසාත්, වර්ෂය පුරා කඩින් කඩ පැවති අධික වර්ෂාව නිසාත්, අමුද්‍රව්‍ය මිල ඉහළ යාම නිසා ද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාදයන් සිදුවන ලදී. | භාරයන් නිම කර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය හා නියාමනය කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්, තෘතීක මට්ටමේ පුරප්පාඩු 03 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 34 ක් පැවතුණි.. | 2021 දෙසැම්බර් 31 දිනට, අදාල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර , ජ්‍යෙෂ්ඨ, ද්විතික හා තෘතීක මට්ටමේ ඇතැම් බඳවාගැනීම් සිදුකිරීමට රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කරන ලදි. | පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලට අනුගතව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජුවම බලපාන පුරප්පාඩු පිරවීම . |